Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයට අයත් ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම)

ආරක්ෂක අමාත්‍යාංශයට අයත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 03 සේවා ගණයට අයත් මුද්‍රණ සේවයේ III පන්තියේ III ශ්‍රේණියේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු 31 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2019.01.21 වැනි දිනට හෝ ඊට පෙර ''රජයේ මුද්‍රණාලයාධිපති, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම)'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

01. තනතුරට බඳවා ගැනීමේ ක්‍රමය :

බඳවාගනු ලබන තනතුරට අදාළව හය (06) මාසික වෘත්තීය පුහුණුවක් ලබා දී එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් අදාළ තනතුරේ බඳවා ගත් දිනය පදනම් කරගෙන ස්ථිර තනතුරට පත් කරනු ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන (N.V. Q 4) මට්ටමේ කුසලතාවය මැන බැලීම සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එහිදී දක්වන කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සෑම ක්ෂේත්‍රයන්ම ආවරණය වන පරිදි අයදුම්කරුවන්ගේ පරිචය මැන බලන අතර ලබා දෙනු ලබන මුළු ලකුණු ප්‍රමාණය 100 ක් වේ.

02. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් හිමිකම පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.)

03. තනතුරට අදාළ වැටුප් ක්‍රමය හා වැටුප් කේත අංකය :

මසකට රු. 29,840 - 10 x 300 - 11 x 350 - 10 x 560 - 10 x 660 - 48,890 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවේ. (රා. ප. ච. අංක. 03/2016 අනුව)

වැටුප් කේත අංකය - MT1- 2016

04. බඳවා ගැනීමේ සුදුසුකම්

4.1 වෘත්තීය සුදුසුකම්
ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් හතර (*NVQ 4*) මට්ටමේ ප්‍රවීණතා සහතිකයන් ලබා තිබීම.

4.2 *පළපුරුද්ද* :
පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) කට නොඅඩු පළපුරුද්දක් තිබීම. (මෙම පළපුරුද්ද විධිමත් ලේඛන මගින් සනාථ කළ යුතුය. මෙම පස් අවුරුදු සේවා කාලය තුළ අයදුම්කරුවන් සේවය සඳහා අර්ථසාධක අරමුදලට/විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවා තිබෙන බවට සනාථ කළ යුතුය.)

4.3 *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :

4.4.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
4.4.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4.4.3 යම් ආගමික නිකායක පැවිදිවරයෙකු නොවිය යුතුය.
4.4.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.
4.4.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
4.4.6 සේවා අවශ්‍යතාවයට මත දිවා රාත්‍රී ඕනෑම සේවා මුරයක සේවය කළයුතු අතර, පවතින රාජකාරි අනුව වසරේ සෑම දිනකම නොපිරිහෙලා තම සේවය සැපයීමට එකඟ විය යුතුය.

4.5 *වයස් සීමාව* :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා උපරිම වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. අයදුම්පත් කැඳවනු ලබන දිනට පසුව ලැබෙන හෝ තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

06. මෙහි සඳහන් නොවන වෙනත් කරුණක් වෙතොත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව තීරණය වේ.

07. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

08. අපේක්ෂකයෙකු කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට යටත් වනු ඇත.

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයට අයත් මුද්‍රණ සේවයේ III පන්තියේ III ශ්‍රේණියේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට විවෘත පදනම යටතේ බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :——————.

2. මුලකුරු සමග නම :——————.
   - සිංහලෙන් :——————.
   - ඉංග්‍රීසියෙන් :——————.

3. ලිපිනය :——————.

4. උපන් දිනය :——————.

5. 2019.01.21 දිනට වයස :

අවු :————. මාස :————. දින:————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.

7. විවාහක/අවිවාහක බව :————————.

8. ජාතික හැඳුනුම්පත් අංකය :————————.

9. දුරකථන අංකය : ජංගම :————————. නිවස :————————.

10. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන බව :————————.

11. අධ්‍යාපන සුදුසුකම් :
* අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

වර්ෂය :————————. විභාග අංකය :————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

* අ.පො.ස. (උසස් පෙළ)

වර්ෂය :————————. විභාග අංකය :————————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් :

i. ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුරට අදාලව NVQ සහතිකය ලබා තිබේද?
(සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය.)
ii. එසේ ලබා තිබේනම් ඒ කුමන මට්ටමද?
iii. වෙනත් වෘත්තීය සුදුසුකම් :

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

13. සේවා පළපුරුද්ද :

..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) කට නොඅඩු සේවා පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් අමුණා ඇත/නැත.

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තව ද මෙහි දැක්වෙන යම් කරුණක් අසත්‍ය බව සනාථ වුවහොත් මා මෙම තනතුර සඳහා සුදුස්සෙක් නොවන බව ද මෙයින් ප්‍රකාශ කර සිටිමි.

______________,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

14. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පහත සඳහන් සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඉහත 1 සිට 13 දක්වා වූ තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියා/නිලධාරිණිය අදාළ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. තවද මෙම නිලධාරියා/නිලධාරිණිය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

______________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :——————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසැල් ප්‍රධානියෙකු/විශ්‍රාමික ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාම දාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 498,960 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙක් ලවා සහතික කරවා ගත යුතුය.

______________,
අත්සන හා පදවි නාමය

දිනය :——————.

ඉහතින් අත්සන් කර ඇති.................. මයා/මිය/මා හොඳින් හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන යෙදූ බවත් මෙයින් සහතික කරමි.

______________,
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————.
නම :——————.

නිල නාමය :——————.

ලිපිනය :——————.